# වාර්ෂික වාර්තාව
# 2006



## උද්භිද උද්‍යාන භාර අරමුදල

ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව
පේරාදෙණිය

# ශ්‍රී ලංකාවේ උද්භිද උද්‍යාන සංවර්ධනය කිරීම සහ ශුභ සාධනය සඳහා භාර අරමුදල

## වාර්ෂික වාර්තාව - 2006 (Annual Report – 2006)

ශ්‍රී ලංකාවේ උද්භිද උද්‍යාන වැඩි දියුණු කිරීම හා ශුභ සාධනය සඳහා භාර අරමුදලක් මැයෙන් එවකට කෘෂිකර්ම ඉඩම් හා වන සම්පත් ඇමතිවරයා විසින් ඉදිරිපත් කරන ලද 1995-12-15 දිනැති සංදේශය සලකා බලා 1996-02-07 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී උද්භිද උද්‍යාන සංවර්ධනය කිරීම සහ ශුභ සාධනය සඳහා භාර අරමුදල පිහිටුවීම සඳහා අනුමැතිය ලබාදී ඇත.

උද්භිද උද්‍යාන සඳහා වන ප්‍රවේශ පත්‍ර විකිණීමෙන් ලැබෙන ආදායමින් වාර්ෂිකව 25% ක් "උද්භිද උද්‍යාන සංවර්ධනය කිරීම හා ශුභ සාධනය සඳහා භාර අරමුදලට ආදායම වශයෙන් වෙන් කරනු ලබන අතර, මෙම අරමුදලේ ප්‍රධාන ආදායම් මාර්ගය එය වේ. ඊට අමතරව අරමුදල ආදායම වැඩිකර ගැනීම සඳහා සුදුසු කාර්යයන් ඉටු කර ගැනීමට ඉඩකඩ සලසා ඇත.

### උද්භිද උද්‍යාන භාර අරමුදල

1. අරමුදලේ නම : ශ්‍රී ලංකාවේ උද්භිද උද්‍යාන සංවර්ධනය කිරීම හා ශුභ සාධනය සඳහා භාර අරමුදල
2. ස්වභාවය : උද්භිද උද්‍යානවල සංවර්ධන කටයුතු සහ අවශ්‍ය අවස්ථාවන්හි පුනරාවර්තන කටයුතුවලට මූල්‍ය සහාය ලබාදීම.
3. අදාළ චක්‍රලේඛයන් : I) අරමුදල ආරම්භ කිරීම - 1917 අංක 09 දරන අරමුදල් ආඥා පනත අනුව
   II) ගිණුම් තැබීම හා ගිණුම් වාර්තා ඉදිරිපත් කිරීම භාණ්ඩාගාර චක්‍රලේඛ 1977 අගෝස්තු 16 දිනැති අංක 836 දරන චක්‍රලේඛය
4. ආරම්භ කළ දිනය : 1996 දෙසැම්බර් 20
5. කාර්යාලය : පේරාදෙණිය ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලය
6. බැංකුව : පේරාදෙණිය ලංකා බැංකුව ගිණුම් අංක 7040848

7. අරමුදලේ පරමාර්ථ :

අ) ශ්‍රී ලංකාව හා විදේශ රටවල් තුළ උද්භිද උද්‍යාන පිළිබඳව පවතින ප්‍රතිරූපය තවදුරටත් යහපත් කිරීමේ ක්‍රියාමාර්ග ගැනීම

ආ) පාරිසරික අධ්‍යාපනික හා ශාක පිළිබඳව දැනට පවත්නා සංරක්ෂණය සම්බන්ධයෙන් අර්ථාන්විත වැඩ සටහන් ක්‍රියාත්මක කොට දියත් කිරීම

ඇ) උද්භිද උද්‍යානයන්හි සේවා නියුක්ත විද්‍යාඥයින්ගේ විද්‍යාත්මක දැනුම ක්‍රියාකාරකම් හා පහසුකම් වැඩි දියුණු කිරීම මෙන්ම අදාල කටයුතු සඳහා අවශ්‍ය උපකරණ මිලදී ගැනීමට මූල්‍යමය ආධාර සැපයීම

ඈ) ශාක එකතුව පිළිබවඳව වර්ධනාත්මක වැඩ පිළිවෙලක් ඇති කිරීම

ඉ) උද්භිද උද්‍යානයන්හි ප්‍රයෝජනය සඳහා පාරිසරික අධ්‍යාපනික සංරක්ෂණ හා වැඩි දියුණු කිරීමේ කටයුතු සම්බන්ධයෙන් කාර්මික ක්ෂෙත්‍රයන්හි ක්‍රියාකාරකම් වර්ධනය කිරීම හා ඊට ආධාර කිරීම

ඊ) විද්‍යාඥයින්ට හා උද්භිද උද්‍යනයට පැමිණෙන අයට අවශ්‍ය පහසුකම් සැපයීම සඳහා අවශ්‍ය ඕනෑම හදිසි ඉදි කිරීමේ කටයුත්තක් භාර ගැනීම

උ) විශේෂිත වැඩ සටහනකදී පුනරාවර්තන අරමුදල් හිගය පියවා ගැනීම

2006 වර්ෂයේ අරමුදලේ මූල්‍ය තත්වය

| | | |
|---|---|---|
| 2006-01-01 දිනට ආරම්භක ශේෂය | = | රු. 32,597,373.47 (බැර) |
| එකතු කළා:<br>වර්ෂය තුළ කරන ලද බැර කිරීම් | = | රු. 19,705,626.59 |
| | | ----------------- |
| | = | රු. 52,303,000.56 |
| අඩු කළා :<br>වර්ෂය තුළ කරන ලද හර කිරීම් | = | රු. 13,143,757.75 |
| | | ----------------- |
| 2007-12-31 දිනට ශේෂය | = | රු. 39,159,242.61 |
| | | =========== |

අරමුදලේ ප්‍රතිපාදන යොදා ගනිමින් 2006 වර්ෂය තුළ ඉටු කරන ලද විශේෂිත සංවර්ධන කාර්යයන්

- උද්‍යාන නඩත්තු කරගෙන යාම සඳහා පුනරාවර්තන වියදම් යටතේ ලැබී ඇති ප්‍රතිපාදන ප්‍රමාණවයත් නොවූ හෙයින් කොන්ත්‍රාත් කම්කරු වැටුප් සඳහා අරමුදල යටතේ රු.මි. 5.9 වියදමක් දරමින් කොන්ත්‍රාත් කම්කරුවන් සේවයේ යොදවා ගෙන උද්‍යාන මනාව නඩත්තු කරගෙන යාමට කටයුතු කර තිබේ.

- පේරදෙණිය උද්භිද උද්‍යානයේ අධ්‍යාපන හා පුහුණු මධ්‍යස්ථානයේ අධ්‍යාපනය ලබන සිසුන්ගේ ප්‍රයෝජනය සඳහා ශ්‍රවනාගාරය වැඩි දියුණු කිරීම හා ඒ සඳහා අවශ්‍ය උපකරණ රු. මි. 3,8 ක වියදමක් දරා සපයා ගෙන ඇත.



ශ්‍රවනාගාරයේ ප්‍රයෝජනය සඳහා ගෘහ භාණ්ඩ මිලදී ගන්නා ලදි



ශ්‍රව්‍ය දෘශ්‍ය උපකරණ භාවිතා කරමින් කරනු ලබන දේශනයකට සහභාගි වන පිරිසක්

| කාර්යය | වියදම රු. |
|---|---|
| 1. කොන්ත්‍රාත් සේවක වැටුප් ගෙවීම | 5,967,573.75 |
| 2. නිලධාරී/සේවක පුහුණු වියදම් | 167,650.00 |
| 3. උද්‍යාන සේවක නිල ඇඳුම් | 53,100.00 |
| 4. සම්මන්ත්‍රණ ශාලාවට ගෘහ භාණ්ඩ ශ්‍රව්‍ය දෘෂ්‍ය උපකරණ මිලදී ගැනීම ආදිය සඳහා | 3,830,326.16 |
| 5. තොරතුරු ප්‍රදර්ශන හා නාම පුවරු | 258,200.00 |
| 6. මල්පැල හා ඇට මිල දී ගැනීම | 69,222.50 |
| 7. උද්‍යාන නඩත්තු හා විවිධ වියදම් | 49,030.00 |
| 8. පේරාදෙණිය උද්‍යානයේ වැසිකිළි අලුත්වැඩියාව | 24,619.45 |

ආචාර්ය ඩී. එස්. ඒ. විජේසුන්දර
ලේකම්, උද්භිද උද්‍යාන භාර අරමුදල සහ
අධ්‍යක්ෂ ජනරාල්
ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව